දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| 32 | S | II |
|---|---|---|

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011

(ආදර්ශ ප්‍රශ්ණ පත්‍රය)

# ව්‍යාපාර අධ්‍යයනය - 11 පත්‍රය

කාලය පැය 03යි.

**සැලකිය යුතුයි.**
**එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

01

I. ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂේත්‍රයේ ප්‍රබල වර්ධනයක් මෑතකාලයේ සිදු වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන කර්මාන්ත ප්‍රතිපත්තියේ පොදු අරමුණු මොනවාද ? (ලකුණු 04)

II. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය ගැලීම් සටහනකින් දක්වන්න. (ලකුණු 04)

III. ව්‍යාපාර පරිසරයට බලපෑම් එල්ලකරන අභ්‍යන්තර හා ආසන්න පරිසර පාර්ශවයන් නම් කරන්න. (ලකුණු 04)

IV. පරිසරය සුරැකීම ව්‍යාපාර ප්‍රජාවගේ වගකීමකි. ඒ අනුව ව්‍යාපාරික කොටස් හරිත නිෂ්පාදන සඳහා පෙළඹී ඇත.

(අ) හරිත නිෂ්පාදන යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද ?

(ආ) හරිත නිෂ්පාදන සඳහා ව්‍යාපාර පෙළඹීමට හේතු 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

V. යාන්ත්‍රික ඉංජිනේරුවකු වන පියල් ශ්‍රී ලංකාවට ඔබින වාහනයක් නිර්මාණය කර නිෂ්පාදනය කිරීමට පෙළඹුනේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ පැවති දුර්වලතා නිසා ය. කර්මාන්තයට අදාල **<u>බදු දිරිගැන්වීම්</u>** නිසා ආනයනික වාහන වලින් එතරම් තර්ජනයක් එල්ල නොවූයේ ය. **<u>රාජ්‍ය පිස්කල් ප්‍රතිපත්තිය</u>** පෞද්ගලික අංශයේ ව්‍යාපාර ප්‍රවර්ධනයට හේතු කාරක විය. රාජ්‍ය බලාධිකාරී ආයතන නියම කරන **<u>සෘජු බදු</u>** කිසිසේත් පැහැර නොහරින පියල් ව්‍යාපාර සඳහා උපදෙස් හා පුහුණුව රාජ්‍ය ආයතන මගින් ලබා ගනී.

ඉහත සිද්ධිය අදාල කරගෙන පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i. ඉහත ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාල බදු දිරිගැන්වීම් වර්ග මොනවාද ?

ii. රාජ්‍ය පිස්කල් ප්‍රතිපත්තිය යන්නෙන් කුමක් අදහස් කරන්නේද ?

iii. පියල් ගෙවනු ලබන සෘජු බදු සඳහා උදාහරණ දෙකක් සපයන්න.

iv. පියල්ගේ ව්‍යාපාරය සඳහා උපදෙස් හා පුහුණුව ලබාගන්නා රාජ්‍ය ආයතන 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

02

I. වෙළඳපල තුල හැසිරෙන තාර්කික පාරිභෝගිකයෙකු විසින් ඉටුකල යුතු වගකීම් කිහිපයකි. ඒවා මොනවාද? (ලකුණු 04)

II. ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එසේ ඉටු කරන කාර්යයන් 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. මැද පෙරදිග රටක සේවය නිමවා මව්බිමට පැමිණි ප්‍රදීපා සිය විදේශ සේවාවෙන් උපයාගත් ධනය යොදවා ස්වාධිනව කටයුතු කිරීමේ අරමුණින් ව්‍යාපාරයක් ඇරඹීය. ප්‍රදීපා අදාල ව්‍යාපාරය තම නමින් නොව වෙනත් නමකින් පවත්වා ගෙන යාමට අදහස් කරන්නීය. මේ සඳහා අදාල වන ක්‍රියාපටිපාටිය පිළිවෙලින් දක්වන්න. (ලකුණු 04)

IV. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ක්ෂේත්‍රය තුල “වරලත් ව්‍යාපාර වර්ධනය විමේ ප්‍රවණතාවක්” දක්නට ඇත. එසේ ක්‍රියාත්මක වන වරලත් ව්‍යාපාර වර්ග නම් කරන්න ? (ලකුණු 04)

V. රාජ්‍ය හිමිකාරත්වය යටතේ ව්‍යාපාර පැවතීම බොහෝ රටවල් වල දක්නට ඇත. රාජ්‍ය හිමිකාරත්වය තුලින් අත් විය හැකි වාසි 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20 )

03

I. (අ)චෙක්පතක චුම්භක තීරුවේ සඳහන් අංකවලින් නිරූපනය වන්නේ මොනවාද ?

(ආ)චෙක්පතක් පිටසන් කිරීම සිදුකරන අවස්ථා මොනවාද ? (ලකුණු 04)

II. ලංකා සෙට්ල් (Settle) යන්නට ඇතුලත් කරන ප්‍රධාන පද්ධති 2 නම් කරන්න (ලකුණු 04)

III. ශ්‍රී ලංකාවේ රක්ෂණ මණ්ඩලය ඉටුකරන කාර්යයන් 4 ක් ලියන්න. (ලකුණු 04)

IV. මෝටර් වාහනයක් මහා මාර්ගයේ ධාවනය කරන විට අනිවාර්යයෙන් ම තිබිය යුතු ලියවිලි මොනවාද (ලකුණු 04)

V. (අ) එක්වර වැඩි පිරිසකට යම් තොරතුරක් දැනුම් දීමටත්, එවෙලේම ප්‍රතිචාර ලබාගැනීම සඳහාත් භාවිතා කලහැකි වඩාත් යෝග්‍ය සන්නිවේදන ක්‍රමය කුමක්ද

(ආ) ව්‍යාපාරයක් විසින් භාවිතා කරනු ලබන විද්‍යුත් සන්නිවේදන ක්‍රම හතරක් නම් කරන්න. (ලකුණු 04)

04

(මුළු ලකුණු 20)

I. සඳුනි සහ හිරුණි ඉන්දියාවට ඇන්තුරියම් මල් තොගයක් අපනයන කිරීමට බලාපොරොත්තුවෙන් සිටී. මේ සඳහා සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරාගැනීම හා අදාල ක්‍රියාපටිපාටි පිළිබඳ ඔබෙන් පිළිතුරු අපේක්ෂා කෙරේ.

(අ) මල් අපනයනයට අදාල වඩාත්ම යෝග්‍ය ප්‍රවාහන මාධ්‍යය වන්නේ කුමක්ද ?

(ආ) එම මාධ්‍යය නම් කිරීමට බලපෑ හේතු මොනවාදැයි පැහැදිල කරන්න.

(ඇ) ඔබ නම් කල මාධ්‍යයට අදාල (A) මාර්ගය හා (B) පර්යන්තය සඳහන් කරන්න. (ලකුණු 04)

II. ලෝකයේ සම්ප්‍රදායික වෙළඳාමෙන් විශාල ප්‍රතිශතයක් වර්තමානයේදී විද්‍යුත් වාණිජ්‍යය අත්පත් කරගෙන ඇත. එයට හේතු මොනවාද ? (ලකුණු 04)

III. මුළු ලෝකයම අද වෙළඳ හවුල් (කලාප) වලට බෙදා ගෙන ඇත. වෙළඳ හවුලක් (කලාපයක්) යනු කුමක්ද ? (ලකුණු 04)

IV. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අරමුණු මොනවාද ? (ලකුණු 04)

V. නිදහස් වෙළඳාම (Free Trade) සහ ආරක්ෂණ වාදය (Protectionism) අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20 )

## II කොටස

05

I. පහත දැක්වෙන්නේ කළමනාකරණ භූමිකා සහ ඒ ඒ භූමිකා සතු කාර්ය භාර්යන් ය. දී ඇති වගුව තුල ඒ ඒ භූමිකාවට අදාළ කාර්යයන් නිවැරදිව දක්වන්න.

* නායකයෙකු ලෙස කටයුතු කිරීම
* ව්‍යවසායකයෙකු වීම
* තොරතුරු බෙදාහරින්නෙකු වීම
* සබඳතා ගොඩනගන්නෙකු වීම
* නියාමන කාර්යයේ යෙදීම
* ප්‍රකාශකයෙකු වීම
* සම්පත් බෙදාහරින්නෙකු වීම
* කේවල් කරන්නෙකු වීම
* ආරවුල් සමනය කරන්නෙකු වීම
* නාමමාත්‍ර ප්‍රධානියෙකු ලෙස කටයුතු කිරීම

| අන්තර්පුද්ගල භූමිකාව | තොරතුරු භූමිකාව | තීරණ භූමිකාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(ලකුණු 04)

II. ව්‍යාපාර සංවිධාන බොහෝ තොරතුරු අධ්‍යයනය කොට සැළසුම් සකස් කෙරුනද ඇතැම් විට සැළසුම් අසාර්ථක වේ. එසේ සැළසුම් අසාර්ථකවීමට බලපාන හේතු කවරේද ? (ලකුණු 04)

III. ව්‍යාපාරයක සංවිධාන සටහනකින් පිළිඹිබු වන තොරතුරු රාශියකි. ඒ මොනවාද ? (ලකුණු 04)

IV. “සෑම ව්‍යාපාර ආයතනයකටම හොඳ නායකයෙක් සිටිය යුතුය.” සංවිධානයකට නායකයෙක් අවශ්‍ය වීමට හේතු මොනවාද ? (ලකුණු 04)

V. තත්ත්ව ආරක්‍ෂණය (Quality Assurance) යනු කුමක්ද ? එවැනි ආරක්‍ෂණ ක්‍රම කවරේද ? (ලකුණු 04)

(මුළු ලකුණු 20 )

06

“හෙල්ත් කෙයාර් ” සමාගමේ නිෂ්පාදන මිශ්‍රය පහත දැක්වේ.

| ළදරු ආහාර | ළමා උපකරණ | සබන් | විෂබීජ නාශක දියර |
|---|---|---|---|
| පිටිකිරි<br>බෝතල් කළ කිරි<br>පළතුරු යුෂ<br>බිස්කට් | ළමා මදුරු දැල්<br>සෙල්ලම් බඩු | සුවඳ සබන්<br>විෂබීජ නාශක සබන්<br>රෙදි සෝදන සබන් | අත් පිරිසිදු කරන දියර<br>ගෙබිම සෝදන දියර<br>ළමා උපකරණ සේදුම් දියර |

I. මෙම සමාගමේ නිෂ්පාදන මිශ්‍රයේ පළල, දිග, ගැඹුර හා සමාන්‍ය ගැඹුර දක්වන්න. (ලකුණු 04)

II. බොහෝ ව්‍යාපාර එක් නිෂ්පාදනයකට පමණක් සීමා නොවී නිෂ්පාදන මිශ්‍රයක් පවත්වා ගෙන යාමට හේතු මොනවාද ? (ලකුණු 04)

III. පාවහන් නිපදවන ආයතන තම පාවහන් මිල ලකුණු කිරීමේදී රු. 499.90, රු. 599.90, රු. 1699.90 ලෙස මිල ලකුණු කරයි.
(1) මෙම මිළ කිරීමේ ප්‍රතිපත්තිය නම් කරන්න.
(11) ව්‍යාපාරයක් තම භාණ්ඩ මිල කිරීමෙන් බලපරොත්තුවන පරමාර්ථ මොනවාද ? (ලකුණු 04)

IV. සුදුසු ප්‍රචාරණ මාධ්‍යයක් තෝරා ගැනීමට පෙර සලකා බලන සාධක මොනවාද (ලකුණු 04)

V. සෘජු අලෙවිකරණයේ (Direct Marketing) ලක්‍ෂණ මොනවාද ? (ලකුණු 04)

(මුළු ලකුණු 20 )

07

I. ව්‍යාපාරයකට අරමුදල් සම්පාදනය කල හැකි මාර්ග ලෙස කෙටිකාලීන අරමුදල් සම්පාදන මාර්ග හා දිගුකාලීන අරමුදල් සම්පාදන මාර්ග දැක්විය හැකිය. එකනෙක මාර්ග සඳහා නිදසුන් දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

II. මූල්‍ය කළමනාකරුවෙකුගේ කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පොදු සමාගමක් දිගු කාලීන අරමුදල් සම්පාදනය සඳහා කොටස් නිකුත් කරන්නේද, ණයකර නිකුත් කරන්නේද යන්න තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක 4 ක් මොනවාද ? (ලකුණු 04)

IV. (අ) ශ්‍රම පිරිවැටුම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ? එය ගණනය කරනුයේ කෙසේද ?

(ආ) වත්මන් සමාජය තුල සේවක අයිතිවාසිකම් පිළිබඳ උනන්දුව වැඩිවෙමින් පවතී. එවැනි අයිතිවාසිකම් දෙකක් නම් කරන්න (ලකුණු 04)

V.

I. ව්‍යාපාරයක ක්‍රියාකාරී අනුපාත (මෙහෙයුම් කාර්යයක්ෂමතා අනුපාත) ගණනය මගින් නිරූපනය කරන්නේ කුමක්ද ?

II. එසේ ගණනය කරනු ලබන ක්‍රියාකාරී අනුපාත 3 ක් නම් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20 )

08

I. සාරභූමි විදුහල පරිගණක විද්‍යාගාරයක්ද, ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් හා ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයකින්ද සමන්විත වූ පාසලකි.

විදුහලේ අධ්‍යාපනික හා පරිපාලන කටයුතු බොහෝ දුරට පරිගණක ආධාරයෙන් සිදු කෙරේ.

(අ) මෙම විදුහලේ පරිපාලනය සඳහා පරිගණක භාවිතා කලහැකි අවස්ථා දෙකක් නම් කරන්න.

(ආ) පරිගණක ජාල පද්ධතියක් පාසැලේ කටයුතු වලට සහාය වන්නේ කෙසේද ? (ලකුණු 04)

II. ආයනයක මෙහෙයුම් මට්ටමේදී භාවිත කරන ගණුදෙනු සැකසුම් පද්ධති කිහිපයක් පහත දැක්වේ.

* ද්‍රව්‍ය ඇණවුම් කිරීම.
*විකුණුම් ඇණවුම් ලබා ගැනීම.
* ද්‍රව්‍ය මිලට ගැනීම.
* මිල කිරීම.
* අයවැය ලේඛන සැකසීම.
* සේවක පැමිණීම වාර්තා කිරීම
* මුදල් ගෙවීම් කිරීම.
* වැටුප් වාර්තා සැකසීම.

ඉහත කරුණු පහත සඳහන් වගුව තුළ නිෂ්පාදන, අලෙවි, මූල්‍ය හා මානව සම්පත් අංශ යටතේ ගොනු කර දක්වන්න.

| නිෂ්පාදන අංශය | අලෙවිකරණ අංශය | මූල්‍ය අංශය (ගිණුම්) | මානව සම්පත් අංශය |
|---|---|---|---|
| | | | |

(ලකුණු 04)

III. සෑම ව්‍යාපාර ආයතනයක්ම තම ආයතනයේ මානව සම්පත් කෙරෙහි අවධානයක් යොමුකල යුත්තේ ඇයි ? (ලකුණු 04)

IV. බොහෝ විට ව්‍යාපාර සැලැස්ම මාර්ග සිතියමකට උපමා කරයි. ඊට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)

V. වෘත්තිය සමිතියක් පිහිටුවීමේ අරමුණු රාශියකි. එවායින් 4 ක් නම් කරන්න (ලකුණු 04)

(මුළු ලකුණු 20 )